කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී පළමු වසර (ආර්ථික විද්‍යාව) 2017 / 2018

**ECN 1204 - ලෝක ආර්ථික සංවර්ධනය සහ ශ්‍රී ලංකාව**

කාලය පැය දෙකක් (02) පමණි

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

---

ප්‍රශ්න අංක 01

i. සංවර්ධන ක්‍රියාවලිය සඳහා කෘෂිකාර්මික විප්ලවයේ බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ආර්ථික වර්ධනය සහ සංවර්ධනය කෙරෙහි කෘෂි අංශයෙහි භූමිකාව ගැඹුරින් විග්‍රහ කරන්න. (ලකුණු 15)

ප්‍රශ්න අංක 02

i. ලෝක කාර්මික සංවර්ධනයට බලපෑ දායකත්ව සාධක පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ආර්ථික වර්ධනය සහ සංවර්ධනය කෙරෙහි කාර්මික අංශයෙහි භූමිකාව ගැඹුරින් විග්‍රහ කරන්න. (ලකුණු 15)

ප්‍රශ්න අංක 03

i. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකය මුහුණ දෙන අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකය මගින් යෝජනා කරන ලද සංවර්ධන ප්‍රතිපත්ති ගැඹුරින් විග්‍රහ කරන්න. මෙම ප්‍රතිපත්ති නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයට පවතින විකල්ප ප්‍රවේශයන්ගෙන් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 15)

ප්‍රශ්න අංක 04

i. බ්‍රිතාන්‍ය පාලන යුගයේදී ශ්‍රී ලංකාවේ රාජ්‍යකරණය ඔබ පැහැදිලි කරන්නේ කෙසේද? (ලකුණු 10)

ii. බ්‍රිතාන්‍ය පාලන යුගයේදී ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් ගැඹුරින් විග්‍රහ කරන්න. (ලකුණු 15)

ප්‍රශ්න අංක 05

"ආර්ථික වර්ධනය ආර්ථිකයේ ප්‍රමාණාත්මක අත්පත් කරගැනීමක් වන අතර, ආර්ථික සංවර්ධනය ආර්ථිකයේ ගුණාත්මක අත්පත් කරගැනීමක් වේ".

i. ආර්ථික වර්ධනයෙහි සහ සංවර්ධනයෙහි මිනුම්දඬු පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අත්පත් කරගැනීම් ගැඹුරින් විග්‍රහ කරන්න. (ලකුණු 15)

ප්‍රශ්න අංක 06

"නිදහස ලබන විට, වේගවත් ආර්ථික සංවර්ධනයකට අවශ්‍ය කරන මූලික කොන්දේසි ශ්‍රී ලංකාව යටත් විජිත පාලන සමයෙන් උරුම කරගෙන තිබුණි".

i. නිදහස ලබන විට ශ්‍රී ලංකාව විසින් අත්පත් කරගෙන තිබූ මූලික කොන්දේසි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. මෙම කොන්දේසි දිගු කාලයේදී තිරසාර ලෙස පවත්වාගෙන යාමට ශ්‍රී ලංකාවට නොහැකි වූයේ ඇයි දැයි ගැඹුරින් විග්‍රහ කරන්න.

(ලකුණු 15)

ප්‍රශ්න අංක 07

"1956 සිට 1977 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් ආවෘත ආර්ථික පද්ධතියක කටයුතු කළේය".

i. ශ්‍රී ලාංකීය ආවෘත ආර්ථිකය තුළ පැවති ප්‍රධාන ලක්ෂණ 02 පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලාංකීය ආනයන ආදේශන උපායමාර්ගය ගැඹුරින් විග්‍රහ කරන්න.

(ලකුණු 15)

ප්‍රශ්න අංක 08

"1977 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව, ආර්ථිකය ලිහිල් කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වහාම සිදුකරන ලදී".

i. ශ්‍රී ලංකා විවෘත ආර්ථිකයෙහි ප්‍රතිපත්ති මිනුම් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. විවෘත ආර්ථික ප්‍රතිපත්තීන්හි අපේක්ෂිත ප්‍රතිඵල ශ්‍රී ලංකාව විසින් අත්පත් කර ගත්තෙහි දැයි ගැඹුරින් විග්‍රහ කරන්න.

(ලකුණු 15)

ප්‍රශ්න අංක 09

" ලෝක බැංකුව සහ අනෙකුත් ජාත්‍යන්තර මූලාශ්‍ර වලට අනුව ශ්‍රී ලංකාව වර්තමානය වන විට විශාල ආර්ථික අභියෝගයන්ට මුහුණ දෙමින් පවතී".

i. මෙම ආර්ථික අභියෝගයන් මොනවාද? අඩු වශයෙන් මෙම අභියෝගයන්ගෙන් දෙකක්වත් (02) පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට බලපාන මෙම අභියෝගයන් ජයගත හැකි ප්‍රතිපත්ති ලෙස ඔබ යෝජනා කරන්නේ මොනවාද?

(ලකුණු 15)